Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ව්‍යාපාර අධ්‍යයනය

සතිය- 4

ශ්‍රේණිය - 13

සකස් කළේ - ඩී. ඩබ්ලිව්. පී. හංසිකා
ර/ ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය

නිපුණතාවය 12.0 : පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.4 : කළමනාකරණ ක්‍රියාවලිය විමසයි.




- **සැලසුම්කරණය** - යම් ආයතනයක් විසින් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කර ගැනීමේත්, ඒවා ඉටු කර ගැනීම සඳහා අදාළ උපාය මර්ග ස්ථාපිත කිරීමේත් ක්‍රියාවලිය සැලසුම්කරණය නම් වේ.
- **සංවිධානකරණය** - ආයතනයක පරමාර්ථ හා අරමුණු සඵලදායි හා කාර්යක්ෂම ආකාරයෙන් ඉටු කර ගැනීම පිණිස සම්පත් වෙන් කිරීම, බලතල පැවරීම හා වැඩ බෙදීම සම්බන්ධ ක්‍රියාවලිය මින් අදහස් වේ. එනම් මානව හා භෞතික සම්පත් අතර විධිමත් සම්බන්ධතාවයක් ගොඩනැගීමයි.
- **මෙහෙයවීම** - ආයතනයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු වල පුද්ගලයන් නිරත කරවීම කෙරෙහි බලපෑම් කිරීම, දැනුවත් කිරීම හා වැඩට උනන්දු කිරීමේ ක්‍රියාවලියයි.
- **පාලනය** - ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුවන ආකාරයෙන් සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂා කිරීමත්, වෙනස් වීම් ඇත්නම් ඒවා හඳුනාගෙන නිවරදි කිරීමේ පියවර ගැනීමත් පාලනයයි.

**අභ්‍යාස** :-

පාසලේ වාණිජ සංගමයේ සභාපති තනතුර ඔබ විසින් දරන බව උපකල්පනය කරන්න. ඒ අනුව 12 ශ්‍රේණිය සඳහා බඳවා ගත් නවක සිසුන්, ඔබේ අංශයට පිළිගැනීමේ උත්සවය පවත්වන ආකාරය කළමනාකරණ ක්‍රියවලියේ මූලික ශ්‍රිත ඇසුරින් පැහැදිලි කරන්න.